**මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - 2020**

------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) උතුරු මැද පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 2019/02 දරන චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ක්‍රමයට අනුව ඉදිරිපත් කර ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂය සමඟ සැසඳිය නොහැක.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.8,433,913 ක් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ හිමිකම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. | ප්‍රාග්ධන ප්‍රදාන වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ සඳහන් කළයුතු වේ. |
| (ආ) | උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද 2019/02 චක්‍රලේඛය හා මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 16 අනුව ස්ථාවර වත්කම් හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කළවිට සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය වටිනාකම රු.18,445,784 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.9,222,892 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සභාවේ සමාලෝචිත වර්ෂයේ ලාභය හා ස්ථාවර වත්කම් රු.9,222,892 කින් වැඩිවී තිබුණි. | ක්ෂය ගණනය කිරීමේදී මෙම වරද සිදුවී ඇති බව පිළිගනිමි. | ක්ෂය ප්‍රතිපත්තියට අනුකූලව ක්ෂයවීම් ගණනය කළයුතු වේ. |
| (ඇ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු රු.3,743,700 ක් තැන්පත් ශේෂයක් ලෙස ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සභාවේ වාර්ෂික ආදායම එම ප්‍රමාණයෙන් වැඩිවී තිබුණු අතර තැන්පතු ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | තැන්පත් ශේෂයන් ආදායම් ලෙස හඳුනා නොගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ඉදිකරන ලද රු.7,217,146 ක ප්‍රාග්ධන වත්කම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා ජංගම නොවන වත්කම් එම වටිනාකමෙන් අඩුවී තිබුණු අතර පුනරාවර්තන වියදම් එම වටිනාකමෙන් වැඩිවී තිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රාග්ධන වත්කම් ස්ථාවර වත්කම් ලෙස හඳුනාගත යුතුවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුලදී බෝක්කු සහිතව මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති 20 ක් සඳහා රු.2,409,907 ක් වියදම් කර තිබුණු අතර එම මාර්ගවලට අදාළ බෝක්කුවල ප්‍රතිසංස්කරණ වටිනාකම හඳුනාගෙන ප්‍රාග්ධනිත නොකිරීම නිසා සභාවේ ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන්ද පුනරාවර්තන වියදම් එම වටිනාකමෙන් වැඩියෙන්ද දක්වා තිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | බෝක්කු ඉදිකිරීම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළයුතු වේ. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.154,260,000 ක් වු ගිණුම් විෂයයන් 02 කට අදාළව විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | පවරා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇත. | අයිතිය තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.13,086,812 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,882,652 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු රු.85,800 ක හිඟහිටි ව්‍යාපාර බදු අයකර ගෙන නොතිබුණි. | 2020 වර්ෂයට පෙර හිඟ කපාහැරීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කර ඇති අතර 2020 වර්ෂයේ හිඟ අයකර ගනිමින් පවතී. | හිඟ බදු අයකර ගත යුතු අතර අය නොවන හිඟ බදු සම්බන්ධයෙන් නීතිමය ප්‍රතිපාදන තුළ කටයුතු කළයුතු වේ. |

**(ආ) කුලී**

---------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 01 ත් 08 ත් අතර කාලයක සිට අයවිය යුතු රු.2,053,137 ක හිඟ ආදායම අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම, නීත්‍යානුකූල පියවර ගැනීම, අයකළ නොහැකි ශේෂ විධිමත්ව කපාහැරීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. | මෙම හිඟ මුදලින් රු.131,532 ක් කපාහැරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. රු.575,271 ක් අයකර ගැනීම සඳහා දැනුවත් කිරීම් සිදුකර ඇත. | සමාලෝචිත වර්ෂයට අදාළ කුලී ආදායම් අයකර ගැනීමටත් විධිමත් අනුමැතිය ලබාගෙන අයනොවන කුලී කපාහැරීමටත්, කටයුතු කළයුතු වේ. |

**(ඇ) වෙනත් ආදායම්**

-------------------

| | | |
|---|---|---|
| දැන්වීම් පුවරු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.231,800 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් අයකර ගැනීම සඳහා නඩු පවරා ඇත. | අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළයුතු වේ. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.56,617 ක අත්තිකාරම් ශේෂයක් සභා අනුමැතියක් ලබානොගෙන සමාලෝචිත වර්ෂයේදී කපාහැර තිබුණි. | මෙය ගිණුම් තැබීමේ දෝෂයක් වන අතර ඉදිරියේදී මෙවැනි දෝෂ නිවැරදි කිරීමේදී සභා අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කරමි | සභා අනුමැතියක් ලබා ගැනීමෙන් පසු කපාහැරීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | සභාව සතු වාහන 06 ක ආදායම් බලපත්‍ර නියමිත දිනට ලබානොගැනීම නිසා 2020 නොවැම්බර් 30 දිනට රු.25,445 ක් ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවී තිබුණි. | පිළිගනිමි | ආදායම් බලපත්‍ර ප්‍රමාද නොකර ලබා ගැනීමට කටයුතු කළයුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) පුරනැඟුම ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබී තිබුණු රු.2,505,266 ක් සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 12 දින වනවිටත් එම ව්‍යාපෘතිය සඳහා වැය නොකර සභාවේ නිල බැංකු ජංගම ගිණුමක නිශ්කාර්යව පැවතුණි. | සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන බව ප්‍රකාශ කරමි. | අරමුදල් නිශ්ක්‍රියව නොතබා ආයෝජනය කිරීමට කටයුතු කළයුතු වේ. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

---

**4.1 පාරිසරික ගැටලු**

---

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් වාර්ෂිකව රු.3,872,340 ක පිරිවැයක් දරා කසළ ටොන් 800 ක ප්‍රමාණයක් රැස්කරන අතර ඉන් කොටසක් භාවිතා කර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරනු ලබන අතර ඉතිරිය අවිධිමත්ව පරිසරයට මුදාහරිමින් පැවතුණි. | ඉදිරියේදී විධිමත් ලෙස කසළ කළමනාකරණය කිරීමට කටයුතු කරමි. | විධිමත් ලෙස කසළ බැහැර කිරීමට කටයුතු කළයුතු වේ. |